www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව තුල බොනපාට්වාදී පාලනයක් ඇටවීමේ අනතුර

**The danger of Bonapartist rule in Sri Lanka**

විජේ ඩයස් විසිනි

2009 දෙසැම්බර් 8

දිවයින තුල පොලිස් - රාජ්‍ය පාලනයක් සඳහා කල්තබාම සූදානම් කෙරෙන ව්‍යාපෘතියක කොටසක් ලෙස, ලබන වසරේ ජනවාරි 26 දින පැවැත්වෙන ජනාධිපතිවරනයේ දී ජෙනරාල් සරත් ෆොන්සේකාගේ අපේක්ෂකත්වය, වැඩකරන ජනතාවට නිකුත් කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි. ගැඹුරුවන ආර්ථික අර්බුදයක් හමුවේ පාලක පැලැන්තියේ බලගතු කොටස් ෆොන්සේකාට පිටුබලය සපයයි. වැඩකරන ජනතාව මත අලුතින් ආර්ථික බර පැටවීමේ වාහකය ලෙස ප්‍රධාන විරුද්ධ පක්ෂවල පොදු අපේක්ෂකයා කටයුතු කරනු ඇත.

පසුගිය මාසයේදී ඉල්ලා අස්වීමට පෙර ෆොන්සේකා රටේ ඉහල ම ජෙනරාල් වූයේය. ජනාධිපති මහින්ද රාජපක්ෂ යටතේ ඔහු, මැයි මාසයේදී පරාජයට පත්කරන ලද එල්ටීටීඊයට එරෙහිව එය මුලිනුපුටා දැමීමේ තිරස්චීන යුද්ධයක් මෙහෙයවීය. ගැටුමේ අවසන් මාසවල, එල්ටීටීඊය අල්ලාගෙන සිටි ප්‍රදේශවලට හමුදාව ඉවක් බවක් නැතිව එල්ල කල බෝම්බ ප්‍රහාරයන්ගෙන් දෙමල සිවිල් වැසියන් 7,000 ක් මිය ගිය බවට ගනන් බලා ඇත. එල්ටීටීඊය බිඳ වැටීමෙන් පසුව හමුදාව විසින් සිවිල් වැසියන් - පිරිමි, ගැහැනු හා ලමුන් - 250,000 කට වැඩි පිරිසක් "ශුභසාධන කඳවුරු" තුලට ගාල් කරනු ලැබිනි. දෙසැම්බර් 1 දින දක්වා ඔවුන් නීති විරෝධී ලෙස ඒවායේ රඳවා තබන ලදී.

යුද්ධය අවසන්වීමත් සමග, පාලක දේශපාලන-මිලිටරි කල්ලියට සමීපව කටයුතු කල ෆොන්සේකා, රාජපක්ෂ සමග විරසක වූයේ ඔවුන්ගේ ඒකාබද්ධ යුද අපරාධ මත නොව යුද ජයග්‍රහනයේ කීර්තිය හිමිවන්නේ කවරෙකුට ද යන්න මතය. සිය බිඳෙන සුලු සහාගයට පැලැස්තර දමා ගැනීම හා පලාත් සභා මැතිවරන මාලාවක් දිනාගැනීම සඳහා රාජපක්ෂ, ජයග්‍රහනයේ නිර්මාතෘවරයා ලෙස තෙමේම පෙරට පැමිනීම මගින් නිලධාරි කුලකය තුල නොමනාපකම් අවුස්සා දැමීය. විශේෂයෙන්ම, හමුදාවේ ප්‍රධානත්වයෙන් ඔහු ඉවත් කොට, බෙහෙවින්ම සංකේතාත්මක වන ආරක්ෂක කාර්ය මන්ඩල ප්‍රධානියාගේ තනතුර ඔහුට පිරිනැමීමෙන් පසුව ෆොන්සේකා, මෙම විරසකයේ හොරනෑව බවට පත් විය. රාජපක්ෂ කල්තබාම ජනාධිපතිවරනය නිවේදනය කිරීමත් සමග මෙම ස්ථරය ෆොන්සේකා තම පොදු අපේක්ෂකයා ලෙස පෙරට වඩම්මා ගත්හ.

ෆොන්සේකා කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයෙකු නොවේ. නිසැකව ම ඔහු, එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග මැතිවරන ගිවිසුම් වලට එලඹ තිබුන ද, බලයට පත්වුවහොත් ඒවායේ ප්‍රතිපත්ති හෝ පක්ෂ විනය මගින් ඔහු ඒවාට බැඳී නොසිටිනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ පශ්චාත් නිදහස් දේශපාලනය තුල පෙර නොවූ විරූ තත්ත්වයක් වන අතර එය සලකුනු කරන්නේ පාර්ලිමේන්තු දේශපාලනයේ ප්‍රගාඪ පරිහානියයි. දශක ගනනාවක සිවිල් යුද්ධයෙන් හා වෙලඳපොල ගැති ප්‍රතිව්‍යුහකරනයෙන්, එජාප හා රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) යන ප්‍රධාන ධනපති පක්ෂ දෙකම පුලුල් සැකයට හා අවමානයට පත්ව තිබේ. ජනතාවගේ අපේක්ෂා හංගයේ හා කලකිරීමේ දේශපාලන ආරක්ෂක කපාටයක් ලෙස ක්‍රියා කරන අතරතුර ස්වෝත්තමවාදී ජවිපෙ, 2004 වසරේදී ශ්‍රීලනිප හවුල් ආන්ඩුවට ඇතුල්වීමෙන් පසුව එහි ජනතා පදනම වේගයෙන් ඛාදනය විය. පසුගිය වසරේදී එය නින්දිත ලෙස බෙදී ගියේය.

පාර්ලිමේන්තු ක්‍රමයේ සම්මතයන් දැනටමත් බිඳී යන තරම් ඇදීමකට ලක්ව තිබේ. රාජපක්ෂ ජනාධිපති තනතුර හොබවන්නේ එහෙන් මෙහෙන් ඇහිඳගත් පක්ෂ 17 ක සන්ධානයක් තුලය. ඒ සියල්ලට ම ලෝකයේ ලොකුම ඇමති මන්ඩලවලින් එකක තනතුරු හිමිව තිබේ. මේ තත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු, කැබිනට් මන්ඩලයෙන් ද පාර්ලිමේන්තුවෙන් ද වඩ වඩාත් දුරස්ථ වෙමින් සිය සහෝදරයන්ගෙන් ද සමීප දේශපාලන ගැත්තන්ගෙන් ද විශ්වාස කටයුතු නිලධාරීන්ගෙන් හා ජෙනරාල් වරුන්ගෙන් ද සැදුම්ලත් කල්ලියක් තුලින් ක්‍රියා කරයි.

විධායක ජනාධිපති ලෙස ඔහු සතු පුලුල් බලතල, දැනට යොදා ගන්නා හදිසි නීතිය මගින් තවත් ශක්තිමත් කර ඇත. එමගින්, අත් අඩංගුවට ගෙන නඩු විමසීමකින් තොරව රඳවා තැබීමටත්, ප්‍රචාරණ වාරනයට හා කම්කරු විරෝධතා මැඩීමටත් ඉඩ සැලසෙයි. ඔහුගේ තන්ත්‍රය අවස්ථා ගනනාවක දී ම ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති අතර ශ්‍රේෂ්ඨාධිකරන නියෝග නොතකා හැර තිබේ.

තම මැතිවරන ව්‍යාපාරය දියත් කරමින් ෆොන්සේකා, රාජපක්ෂ "බාල ගනයේ ඒකාධිපතියෙකු" ලෙස හංවඩු ගසමින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ එජාප හා ජවිපෙ ඉල්ලීම් බදාගෙන සිටියි. මේ පොරොන්දුව කෙරෙහි හෝ, ජෙනරාල් ප්‍රජාතන්ත්‍රවාදී සලුපිලිවලින් දැවටීමට විරුද්ධ පක්ෂ විසින් දරන උත්සාහය කෙරෙහි හෝ, කිසිදු විශ්වාසයක් තැබිය නොහැකිය. විරුද්ධ පක්ෂයේ සිටින විට දේශපාලන නායකයන් වතාවතක් ලෙස විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට ප්‍රතිඥා දී ඇති නමුත් බලයට පැමිනි පසු එම පොරොන්දු කසල ගොඩට දැමීම ද පුරුද්දක් වී තිබේ. රාජපක්ෂට පූර්වයෙන් ජනාධිපතිව සිටි චන්ද්‍රිකා කුමාරතුංග, 1994 බලයට පැමිනීමට පෙර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට පොරොන්දු වූවාය. එහෙත් ඇය කලේ, එය සතු පුලුල් බලතල යොදාගනිමින් 2004 වසරේ තේරී පත්වූ එජාප ආන්ඩුව අත්තනෝමතික ලෙස විසුරුවා හැරීමයි.

කෙසේ වෙතත්, මීට පෙර සිටි ජනාධිපති වරුන්ට මෙන් ෆොන්සේකාට, දේශපාලන පක්ෂයක් හෝ ඔහුගේ ම සැලකිය යුතු සහයෝගිතා පදනමක් නැත. ජයගතහොත් ඔහුට, එකිනෙකා සමග තරග වදින දේශපාලන බලවේග අතර තුලනය වීමට දරන උත්සාහයේදී, තම ජනාධිපති බලතල මුලුමනින්ම ප්‍රයෝජනයට ගැනීමට සිදුවනු ඇත. ඔහුගේ ප්‍රධාන ඡන්ද බල වැයික්කිය වන්නේ ඔහුට පිටු බලය සපයන විරුද්ධ පක්ෂ හෝ නිසැකව ම ඔහුගේ ඡන්දදායකයන් ද නොවේ. සියල්ලටමත් වඩා ඔහු, රාජ්‍ය යාන්ත්‍රනයේ, විශේෂයෙන්ම, දැවැන්ත මිලිටරියේ හමුදා නිලධරය හා තම ආර්ථික න්‍යාය පත්‍රය අවහිරවී තිබීමෙන් වික්ෂෝභයට පත්ව සිටින පාලක පන්තියේ ම කොටස් වල හොරනෑවකි. ෆොන්සේකා නියම බොනපාට්වාදී චරිතයක් ලෙස ඉස්මතු වෙමින් සිටියි. - දේශපාලන හබයෙන් ඉහලට නැගී සිටින බවක් පෙන්නුම් කරන, ජාතියට පලදායි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බව කියා පාන හා නග්න පොලිස්-මිලිටරි ආඥාදායකත්වයක පාද පාෂානයක් වන ප්‍රමුඛයෙක්-

1930 ගනන්වල ජර්මනිය තුල නාසිවාදය දේශනාකල බලවේග පිලිබඳ සිය විනිවිද යන විශ්ලේෂනයේදී ලියොන් ට්‍රොට්ස්කි, බොනපාට්වාදය නැගී එන්නේ නිශ්චිත කොන්දේසි යටතේ පමනක් බව පැහැදිලි කලේය. "ඇත්තන් හා නැත්තන් ද, සූරා කන්නවුන් හා සූරා කැවෙන්නවුන් යන සමාජ ස්තරයන් දෙක අතර අරගලය එහි උච්ඡතම ආතතිය කරා ලඟාවූ වහාම, නිලධරයේ, පොලීසියේ හා හමුදාවේ ආධිපත්‍යය සඳහා කොන්දේසි සකස් වෙයි. ආන්ඩුව සමාජයෙන් ස්වාධීනත්වය අත්කර ගනියි. අපි යලි වතාවක් පහත සඳහන් දේ සිහියට නගා ගනිමු. ගෑරුප්පු දෙකක් සමමිතික ලෙස කිරල මූඩියකට ගැසූ විට කිරල මූඩියට ඇල්පෙනෙත්ති තුඩක පවා තුලනය විය හැකිය. බොනපාට්වාදයේ සැලැස්ම නම් හරියට ම මෙයයි." එහි ස්වභාවයෙන්ම, පාලනයේ එවන් ක්‍රමයක් අස්ථාවර හා තාවකාලික ය.

කම්කරු පන්තියේ පැරනි නායකත්වයෙහි ද්‍රෝහිත්වයේ ප්‍රතිඵලයක් ලෙස, අද මෙරට තුල පන්ති ගැටුම දේශපාලන රූපයකින් තවමත් එලිමහනට පැමින නැත. ප්‍රධාන ධනේශ්වර පක්ෂ මෙන්ම ලංකා සම සමාජ පක්ෂය හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ද ප්‍රගාඪ ලෙස පරිහානියට පත්ව තිබේ. ඔවුන් කටයුතු කරන්නේ ශ්‍රීලනිප හා රාජපක්ෂ ආන්ඩුවේ කීකරු පාර්ශවකරුවන් ලෙස ය. සීමිත වැඩ වර්ජන හා විරෝධතා පැනනැඟී තිබුනත් ඒවා, වෘත්තීය සමිති නායකත්වයන් විසින් ඉක්මනින්ම පාවාදෙනු ලැබ ඇත.

කෙසේ වුව ද දේශපාලන සංස්ථාපිතය ද හොඳින්ම දන්නා පරිදි, නරක අතට හැරෙන ආර්ථික අර්බුදය ආන්තික සමාජ ආතතියක වාතාවරනයක් නිර්මානය කර තිබේ. රාජපක්ෂ සිය මිලිටරි ජයග්‍රහනය අත්කර ගත්තේ ඉමහත් ආර්ථික හා මිනිස් ජීවිතවල වියදමෙනි. රාජපක්ෂගේ සිව් වසරක පාලන කාලය තුල ආරක්ෂක වියදම රුපියල් බිලියන 629 ක් (එජ ඩොලර් බිලියන 5.5) නැතහොත් රජයේ මුලු ආදායමෙන් සියයට 25 කට වැඩි ප්‍රමානයකි. මෙම වසර තුල රටේ සමුච්චිත නය රුපියල් බිලියන 4.023 ක් හෝ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 90 ඉක්මවනු ඇතැයි ගනන් බලා තිබේ.

රාජපක්ෂට සිය යුද්ධය සඳහා ගෙවීමේ හැකියාව ලැබී තිබුනේ, ගෝලීය මූල්‍ය අර්බුදයත් සමග දැන් වියැකී ගොස් තිබෙන, ලාභ ජාත්‍යන්තර නය පදනමට පින්සිදු වන්නටය. ලංකාවේ අසාධ්‍ය විදේශ සංචිත අර්බුදයක් නිර්මානය කරමින් ජාත්‍යන්තර ආර්ථික පසුබෑම, අපනයන ද පහත හෙලා ඇති තත්වය හමුවේ, ආන්ඩුවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) ඩොලර් බිලියන 2.6ක නයක් ගැනීමට සිදු විය. ජාමූඅ පනවා ඇති දැඩි කොන්දේසි අතර, මෙම වසර තුල අයවැය හිඟය දදේනි න් සියයට 9 සිට 7 දක්වා අඩු කිරීමත්, ඉදිරි දෙවසර තුල එය තවත් සියයට දෙකකින් කපාහැරීමත් ඇතුලත්ය.

පසුගිය මාසයට යෙදී තිබුනු 2010 වසරේ අයවැය, මැතිවරනය අවසන් වන තෙක් කල් දැමීම

මගින් රාජපක්ෂ, රාජ්‍ය අංශයේ රැකියා, වැටුප් හා අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන්හි නොවැලැක්විය හැකි කප්පාදුව ප්‍රමාද කර තිබේ. ඒ සමග ම ඔහු, රාජ්‍ය අංශයේ වැටුප් කැටිකිරීම දිගටම පවත්වාගෙන යන අතර, වරාය, විදුලිබල, ජල සම්පාදන හා ඛනිජ තෙල් සංස්ථා කම්කරුවන්ගේ වැටුප් උද්ඝෝෂනය නීති විරෝධී කරමින් ප්‍රථම වතාවට අත්‍යවශ්‍ය සේවා නියෝගයක් නිකුත් කිරීමට සිය හදිසි අවස්ථා රෙගුලාසි යොදාගත්තේ මෑතකදීය. සියලු වෘත්තීය සමිති වහාම යටත් වෙමින් තම උද්ඝෝෂනය හකුලා ගත්හ.

ව්‍යාපාරිකයේ පංගුකරුවෝ පොදු වියදම්වල දරුනු කපා හැරීමක් ඉල්ලා සිටිති. පසුගිය සතියේ පැවති ඒකාබද්ධ සාකච්ඡාවක දී ලංකා වෙළඳ මන්ඩලයේ සභාපති අනුර ඒකනායක දැඩි ලෙස මැසිවිලි නගමින්, "නිෂ්පාදන පිරිවැය මෙතරම් ඉහල ගොස් ඇත්තේ රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතාව නිසා" බවත් "මෙම තේරුමක් නැති සහන හා දිරිගැන්වීම්" නතර කල යුතු බවත් අවධාරනය කලේය. යුද්ධයේ අවසානය ජීවන තත්වයන් තව දුරටත් පිරිහී යාමට පමනක් තුඩුදී තිබීම ගැන දැනටමත් අසහනයට පත්ව සිටින වැඩකරන ජනතාව අතර, එවන් පියවර මගින් නොවරදවා ම ජනනය කරනු ඇත්තේ කැරලිකාරිත්වයකි.

කොලඹ පාලක පැලැන්තිය, මැතිවරනයෙන් පසුව ගැටුමකට සූදානම් වෙමින් සිටියි. සමහර කොටස් රාජපක්ෂට තල්ලුව දෙන අතර දැඩි මතධාරියෙක් ලෙස ෆොන්සේකාට පිටුබලය දෙන අනෙක් කොටස, කම්කරු පන්තියට එරෙහිව රාජ්‍ය යාන්ත්‍රනය මෙහෙයවිය හැකි හා අවශ්‍ය වුවහොත්, හුදෙක් දේශපාලන පක්ෂ හා පාර්ලිමේන්තුව නොතකා කටයුතු කල හැකි බලවතා ලෙස ඔහුව සලකයි. ආරක්ෂක සංස්ථාපිතයේ පිටුබලය සහිත නිර්දය මිලිටරි ආඥාපතියෙක් ලෙස ඔහුගේ අතීත වාර්තාව, අඩමාන පාර්ලිමේන්තු සන්ධානයක් මත ඔට්ටු අල්ලන රාජපක්ෂට වඩා වෙනස් වූවකි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිලිබඳ ඔහුගේ සියලු රඟපෑම් තිබියදී ම ෆොන්සේකා, සිය මැතිවරන නිවේදනය තුලින් අවධාරනය කලේ දූෂනය පිටුදැකීම, පාතාලය ශුද්ධ කිරීම හා සමාජය තුල "විනය" පිහිටුවීම පිලිබඳ සිය අභිලාෂයයි.

සියලු ප්‍රධාන දේශපාලන පක්ෂ, රාජපක්ෂ ෆොන්සේකා තරගයේදී එක් හෝ අනෙක් පාර්ශවය සමග පෙලගැසෙමින් සිටියි. නව සමසමාජ පක්ෂයේ හා එක්සත් සමාජවාදී පක්ෂයේ පැරනි රැඩිකලුන් නාමිකව ෆොන්සේකාට විරුද්ධ වුවත්, රාජපක්ෂ වෙනුවට "ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක්" ලෙස එජාප යට ඔවුන් දෙන සහයෝගය මගින් ජෙනරාල්වරයා ද එවැන්නෙකු ලෙස වෙස්ගැන්වීමට එම දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂයට අවස්ථාව ලබා දෙයි.

කම්කරු පන්තිය මුහුනපා සිටින බලවත් අන්තරාය වන්නේ, එය දේශපාලනිකව මුලුමනින්ම නුසූදානම්ව සිටීමයි. වර්තමාන දේශපාලන පක්ෂ හා ඒවායේ අපේක්ෂකයන් කෙරෙහි මෙන්ම වෘත්තීය සමිති ද කෙරෙහි දක්වන පිලිකුල හා එදිරිවාදිකම් පමනක් පොලිස්-රාජ්‍ය පාලනයක් මතුව ඒමට එරෙහිව සටන් වැදිය හැකි දේශපාලන ක්‍රියාමාර්ගය හා නායකත්වය බවට ඉබේම පරිවර්තනය වන්නේ නැත. එලඹෙන මැතිවරනයට සමාජවාදී සමානතා පක්ෂය ඉදිරිපත් වන්නේ, ධනේශ්වරයේ සියලු කොටස්වලට එරෙහිව සමාජවාදී විකල්පයක් වටා කම්කරුවන් හා තරුනයන් බලමුලුගැන්වීමටත් ඔවුන් උගන්වා ගැනීමටත් ය.

ෆොන්සේකාගේ ඉස්මතුවීම දකුනු ආසියාවේ මෙන්ම ජාත්‍යන්තරව ද කම්කරු පන්තිය සඳහා පුලුල් ඇඟවුම් ගැබ්කර ගනියි. ලංකාව තුල වර්ධනය වන අර්බුදයට දායකත්වය සැපයූ සියලු දේශපාලන හා ආර්ථික ක්‍රියාවලීන්, දියුනු කාර්මික රටවල් ද ඇතුලුව ලෝකය පුරාම අඩු හෝ වැඩි තරමින් දිගහැරෙමින් තිබේ. නරක අතට හැරෙන ආර්ථික කොන්දේසි, ගැඹුරුවන සමාජ ධ්‍රැවාන්තගතවීම, පවතින දේශපාලන පක්ෂවලින් ජනතාව වියෝවීම, පාර්ලිමේන්තු දේශපාලනයේ ජරපත් වීම හා පොලිස්-රාජ්‍ය ක්‍රමවේදයන්, ඊනියා සංවර්ධනය වන රටවල පරවේනියක් නොවේ. මෙම කුඩා දිවයිනෙහි සිදුවන දෑ, ජාත්‍යන්තරව වර්ධනය වෙමින් තිබෙන්නේ කුමක් ද යන්න පිලිබඳව අතීතයේදී මෙන්ම, වැඩ කරන ජනතාවට කෙරෙන අනතුරු ඇඟවීමකි.

© www.wsws.org